# ජානක හා වජිරා වෙනුවෙන් ලන්ඩනයේ දානමය පිංකමක්



අනුරාධපුරයේ දී කොටි ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයකට ගොදුරුව නොබෝ දා මියගිය රණවිරු මේජර් ජෙනරාල් ජානක පෙරේරා මහතා සහ ඔහුගේ බිරිඳ වජිරා පෙරේරා මහත්මිය සිහි-කොට ඔවුන්ට පිංපැමිණවීම පිණිස දානමය පුණ්‍යකර්මයක් ගිය මස 18 වෙනි දින ලන්ඩනයේ එඩ්මන්ටන්හි සමාධි බෞද්ධ විහාරස්ථායෙදී විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුවිය. සමාධි බෞද්ධ විහාරාධිපති පූජ්‍ය ගුන්නැපානේ සුමනාරාම ස්වාමීන් වහන්සේ පිරිස පන්සිල්හි පිහිටුවා අනුශාසනාවක් කළහ. අනතුරුව පැන් වඩා මියගිය ඒ දෙදෙන ඇතුළු මෙතෙක් දිවිපුදා ඇති සියළු රණ විරුවන්ට පින් පමුණුවන ලදී.

මෙම දානමය පිංකම සංවිධාන ය කරන ලද්දේ වන්න සී. ලොකු ලියන මහතා මූලිකව එක්සත් රාජධානියේ වාසය කරන සිංහල දේශප්‍රේමී හිත වතුන් පිරිසක් විසිනි.



මේජර් ජෙනරාල් ජානක පෙරේරා මහතා

# වර්ෂපූර්ණ සාදර සිහිකිරීමයි!



## සුනීතා කීර්තිචන්ද්‍ර මහත්මිය

ඔබ අප අතරින් වියෝවී වර්ෂයක් සම්පූර්ණවන 2008 නොවැම්බර් 21 වෙනි දින සවස නිවසේ සුමධුර ධර්මදේශනාවකි. පසුදින සංඝගත දක්ෂිණාවකි. ඒ පින් බෙලෙන් අකල් මරණය කට ගොදුරු නොවී සසර කෙළවර ඔබට නිවන් සුව අත්වේවායි ! ප්‍රාර්ථනා කරමු..

*ගාමිනී කීර්තිචන්ද්‍ර*

*දරුපිරිස හා නෑදෑහිතවතුන්*

Enfield Middx UK

# මාර්ග අනතුරු සඳහා වැයවූ මුදල් කන්දරාව රුපියල් බිලියන 100 කි

ශ්‍රීලංකාවේ පසුගිය දස වසර තුළ සිදුවූ මාර්ග අනතුරුවල වටිනා කම රුපියල් බිලියන 100 කට වඩා වැඩි බවත්, එම අනතුරු වලින් වාහන දස ලක්‍ෂයකට වඩා සංඛ්‍යාවකට හානි සිදුව ඇති බවත්, ශ්‍රීලංකාවේ දින දින වැඩිවෙමින් පවතින මාර්ග අනතුරු සංඛ්‍යාව පිළිබඳ සොයාබැලීමට පත් කළ 23 දෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තු කමිටුවේ වාර්තාවෙන් අනාවරණයවිය. වාර්තාව ගිය සතියේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණ.

අනතුරු වලින් 59 % ක් ම සිදුව ඇත්තේ කොළඹට කිලෝ මීටර් 50 ක් ඇතුළතය. ප්‍රදේශයට ඔරොත්තු නොදෙන තරම් වාහන සංඛ්‍යාවක් ධාව නයවීම මීට ප්‍රධාන හේතුව බව සොයාගෙන ඇත.

2007 මැයි මාසයේ ශ්‍රීලංකාවේ ලියා පදිංචි කරන ලද වාහන සංඛ්‍යාව 31,25,794 කි. ඊට පසු මෙම වසරේ අගෝස්තු වන විට තවත් වාහන 1,81,290 ක් ලියාපදිංචිකර ඇති බව වාහන ලියා-පදිංචිකරන දෙපාර්තමේන්තුව පවසයි. ශ්‍රීලංකාවේ සිදුවන වාහන අනතුරු වලින් බාගයක්ම වේග යෙන් රිය පැදවීම, සුදුසු තැන නොබලා අනෙක් වාහනවලට ඉස්සරකිරීම, සිග්නල් නොදැමීම, බීමත්කම සහ මාර්ග නීති නොසලකාහැරීම නිසා සිදුවූ ඒවා ය. අනතුරු සිදු වූ පසු කළ සොයා බැලීම්වලින් පොලීසියට පෙනීගොස් ඇත්තේ එම රියැදුරන් 48 % ක් ම රියැදුරු ලැයිසම නැති අය බවත්, ඔවුන්ට වාහන පැදවීමට වසර දෙකකට වඩා පළපුරුද්දක් නොමැති අය බවත් ය.

පසුගිය අවුරුදු 30 ඇතුළත වාහන අනතුරු 1,20,848 සිදුවී ඇත. ඉන් මියගිය සංඛ්‍යාව 40,000කි. තුවාල ලැබූවෝ 3,20,000 ක් වෙතියි වාර්තාව පෙන්නා දෙයි.

♦ *ලක්ෂමී ද සිල්වා* *Sri Lanka*

# Sinhala Lesson 127 සිංහල පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Conditional Verb - If අසම්භාව්‍ය ක්‍රියාව

When we are not sure whether an action happened or is happening or not, we use expressions like - **If.** "If it rained", If it didn't rain", " If it rains", " If it does not rain" etc. When using conditional verbs in Sinhala, the suffixes ඔත් / වොත් / හොත් or the connective නම් are added to verb in the clause of a complex sentence as shown in the examples below:-

1 වැස්සොත්/වහින්නේ නම් අපි ක්‍රිකට් තරඟය නවත්වන්නෙමු
If it rains we shall stop the cricket match.

2 ඔබ බෙහෙත් ගත්තොත්/ගන්නේ නම් තුවාලය සනීපවෙයි.
If you take medicine the wound will heal.

3 බිම වැටුනොත් /වැටුනේ නම් ළදරුවා අඬන්නේය.
The infant will cry if it falls / fell on the floor.

4 සරත් උනන්දුවෙන් පාඩම් නොකළහොත් / නොකරන්නේ නම් විභාගයෙන් අසමත්වන්නේය.
If Sarath does not study well he will fail the exam.

5 හිම වැටුණහොත් මම ගෙදර නවතින්නෙමි.
If it snows I would stay at home.

**Try to identify conditional verbs in what you read and try to use them in sentences**.

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 104

**හරහට :**
1 පහත රට රදල පෙළ
3 සමාන හෝ පොත්ත යන තේරුම දෙයි
5 මැණික්වලට ප්‍රසිද්ධ ය
7 වාදන භාණ්ඩ
8 මඳ සුළඟ
10 සුවසේ

**පහළට :**
1 සිය ගණනක්
2 වයසක ඥාතියා
3 වටිනා ගස් වර්ගයක්
4 කොළඹ ප්‍රධාන පළාතක්
6 රජතුමා 9 වැදුණු

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | ■ | 3 | 4 |
| 5 | | 6 | | |
| 7 | | | ■ | |
| | ■ | 8 | 9 | |
| 10 | | | | ■ |

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට :** 1 තම 3 කද 4 කරවල 6 ටකරන් 7 තත 8 තරු 10 ගියදා
**පහළට :** 1 තකට තක 2 මරකත 3 කලන්තය 5 වර 9 රුදා

# OBITUARY

## ටියුඩර් ද සිල්වා මහතා




## Mr Tudor De Silva

**Husband of Marie Stella Wijayanayaka, Father to Dhaminda Francis Tudor De Silva, Brother of Edward, Gilbert, Douglas, Hilda and Leonard (Late) passed away in London.**

**The funeral took place at London's South Gate Crematorium on 29 October 2008**

**May He Rest In Peace !**

# ♥ පැටියො ඩාලිං



" පැටියො දන්නවයි වැඩක්? අන්න ඔසාමා දිනලා....."

" අයියෝ..... ඔසාමා නෙවෙයි ඕයි... ඔබාමා..... ඔබාමා ....."

# නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

## කුකුල් මස් සමග අන්නාසි
## Pineapple & Chicken

***අවශ්‍ය ද්‍රව්‍ය :*** සාමාන්‍ය ප්‍රමාණයේ කුකුළෙක්

| | |
|---|---|
| බොම්බයි එනු ගෙඩි | 2 ක් |
| සුදු එනු බික් | 5 ක් |
| තක්කාලි ගෙඩි | 2 ක් |
| කරදමුංගු කරල් | 3 ක් |
| කහ තේ හැඳි | ½ ක් |
| කුඩාවට කපාගත් | |
| අන්නාසි කෝප්ප | ½ ක් |
| කුරුඳු කැබැල්ලක් සහ ලුණු | |

***සාදන ක්‍රමය :*** කුකුළා සුද්ධ කර හොඳින් සෝදා සාමාන්‍ය ප්‍රමාණයේ කැබලි වලට කපා වතුර බේරෙන්නට තබන්න. ඉන්පසු ඒවා මුලින් ලුණු අතගා, දෙවනුව කහ කුඩු අතගා පසෙක ටික වේලාවක් තබන්න. තක්කාලි උණු වතුරේ දමා පොතු හැර, පොඩිකරගන්න.

බඳුනකට තෙල් දමා රත්කර, සිහිනියට ලියාගත් බොම්බයි එනු එහි බැදෙන්නට හරින්න. ඉඟුරු සහ සුදුළුනු එකට අඹරා තෙලට එකතු කරන්න. ඉන්පසු එයට කුකුල් මස් කැබලි එකතුකර හොඳින් කළවම් කරමින් හොඳින් බදින්න. පසුව එයට අනෙක් සියළු ද්‍රව්‍යයන් දමා කළවම් කර වතුර කෝප්ප බාගයක්ද වත්කරන්න. දැන් කපාගත් අන්නාසි කැබලිද එක්කරන්න. අවසානයේ බැදගත් කජු මදත් එයට එක් කිරීමෙන් තවත් රසවත් කරගත හැකිය.

♦ *කෞශල්‍යා ගුණසේකර*
Thornton Heath, Surrey UK

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432
සැම්ස් චිකන්